ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය

මධ්‍ය වාර පරීක්ෂණය - 2014

සිංහල භාෂාව හා සාහිත්‍යය

6 ශ්‍රේණිය

නම/ අංකය : .................................................................. කාලය පැය 2

I කොටස

- ප්‍රශ්න සියල්ලට ම පිළිතුරු සපයන්න.

★ හිස්තැනට සුදුසු වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

මනස්කාන්ත වූ දිය (1)........................ ( අගල, අඟල ) දුටු ඕ කොමෝ එයින් (2)........................ (වශීකෘත ව , වෂීකෘත ව ) දැස් අයා බලා සිටියා ය. සිසිල් මඳ (3)........................(නළ, නල) ගතට සිතට සිසිලක් ගෙන දෙන ලදී. හිරු අවරගිරින් බැස යන විට අහස නේක (4)........................ (වර්ණයෙන් , වර්නයෙන් ) දිස් විය. නිවැසියෝ අඳුර වැටෙත් ම(5)........................ (පහන් , පහණ්) දැල්වූහ.

(6) සරු - නිසරු නම් - උදාසීන

(i) කම්මැළි (ii) පරාධීන (iii) කඩිසර

(7) සඤ්ඤක අක්ෂරයක් නොයෙදුණු වචනය තෝරා යටින් ඉරක් අඳින්න.

(i) පාඨශාලාව (ii) වැඳිරිය (iii) දොඹකරය

(8) සුරංගනාවී යන පදයේ ඉරි ඇඳි අකුරුවල යෙදී ඇති පිල්ලම් හඳුන්වන්නේ,

(i) පාපිල්ල , ඇදපිල්ල , ඉස්පිල්ල යනුවෙනි

(ii) පාපිල්ල , ඇලපිල්ල , දීර්ඝ ඉස්පිල්ල යනුවෙනි

(9) මහාප්‍රාණ අක්ෂරයක් නොයෙදුණු වචනයක් ඇතුළත් පිළිතුර වන්නේ,

i) සාර්ථක, ධර්මය ii) ගාථාව, ඡායාව iii) ඡන්දය, විශාල

(10) "නරි රංචුව හූ කියති" මෙම වාක්‍යයේ "කියති " යන පදය

i) වර්තමාන කාල ක්‍රියා පදයකි

ii) අතීත කාල ක්‍රියා පදයකි

iii) අනාගත කාල ක්‍රියා පදයකි

(11) පහත දැක්වෙන වාක්‍යයේ ඇති විරාම ලකුණු පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න

"අර අර බලන්න ! එළිය පාත් වෙනවා, ඉස්සෙනවා "

i) කොමාව, ප්‍රශ්නාර්ථ ලකුණ, හර්ෂාදි ලකුණ

ii) පෙරළි කොමාව, හර්ෂාදි ලකුණ, ප්‍රශ්නාර්ථ ලකුණ

iii) පෙරළි කොමාව, හර්ෂාදි ලකුණ, කොමාව

(12) මිනිසෙක් ගමනක් යද්දී මංමුලා ව වනාන්තරයේ අතරමං විය.

මෙහි ඉරි ඇඳිපදය

i) කර්ම පදයකි ii) උක්ත පදයකි iii) අනුක්ත පදයකි

(13) වාලුකා, භෝජන, වෑයම යන පදවල අර්ථය නිවැරදි ව දක්වා ඇති පිළිතුර වන්නේ.

i) වරකා, ආහාර, උනන්දුව ii) වැලි, ආහාර, උත්සාහය iii) වැලි, ආහාර, මහන්සිය

(14) පහත දැක්වෙන පද යුගල පදයක් වීමට යෙදිය යුතු පද වන්නේ.

මුදල් .................. අඩුම .................... දිනුම් ....................

i) හදල්, කුඩුම, පැරදුම් ii) හදල්, වැඩිම, පැරදුම් iii) හදල්, වැඩිම, කණුව

(15) දරුවනි, විනීත ව හැසිරෙන්න

ඉහත වාක්‍යයේ ඉරි ඇඳි පදය,

i) නිපාත පදයකි ii) විධි ක්‍රියා පදයකි iii) උක්ත පදයකි

(16) නිපාත පදයක් නොවන්නේ,

i) සඳහා ii) වෙනුවෙන් iii) විමසා

(17) උප්පිඩි යනු

i) පිදුරු ගොඩකි ii) ගොයම් අහුරු ය iii) වී ගොඩකි

(18) "උදව් ලබන්නට ගිය අයගෙන් ම විපත් පැමිණීම" යන්නට යෙදෙන ප්‍රස්තාව පිරුළ වන්නේ.

i) උඩින් මිතුරු යටින් හතුරු

ii) වඳින්න ගිය දේවාලේ හිස මත කඩා වැටුණා වාගේ

iii) දඹුලු ගිහින් තලගොයිත් මරාගෙන ආවා වගේ

★ නිවැරදි පද තෝරා යටින් ඉරක් අඳින්න

(19) එලබර .................... පක්ෂීන්ට සුව ගෙන දෙති.

i) වෘක්ෂයෝ ii) වෘක්ෂයන් iii) වෘක්ෂ

(20) වැත්තෑවේ හිමි ගුත්තිල කාව්‍යය ....................

i) ලියුවේ ය ii) ලියූහ iii) ලිව්වා ය

(ලකුණු 2X 20=40)

## II කොටස

මෙහි 1 හා 2 ප්‍රශ්න අනිවාර්ය වේ. තවත් ප්‍රශ්න 3ක් තෝරාගෙන ප්‍රශ්න 5කට පිළිතුරු සපයන්න.

(1) පන්ති කාමරයේදී ඔබ විසින් සිදු කරන ලද කණ්ඩායම් ක්‍රියාකාරකම් ඇගයීම ඇසුරෙන් පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i) ඔබ කණ්ඩායම් ක්‍රියාකාරකම සඳහා තෝරා ගත් මාතෘකාව කුමක් ද? (ලෑ: 1)

ii) ඔබට ලැබුණු මාතෘකාව යටතේ කරුණු සොයා ගත්තේ කෙසේද? (ලෑ: 3)

iii) කරුණු සෙවීමේදී මුහුණ දුන් ගැටලු 3ක් ලියන්න. (ලෑ: 3)

iv) කණ්ඩායමක් ලෙස ක්‍රියා කිරීමේදී ඔබට ලැබුණු වාසි 3ක් ලියන්න. (ලෑ: 3)

v) කණ්ඩායම් ක්‍රියාකාරකම තුළින් ඔබ ලබා ගත් ඉගෙනුම් අත්දැකීම් 2ක් ලියන්න. (ලෑ: 3)

vi) කණ්ඩායම් ක්‍රියාකාරකම අවසන් වූ පසු එහි සාර්ථකත්වය ගැන ඔබට සිතුණු දේ කෙටියෙන් විස්තර කරන්න. (ලෑ: 3)

(මුළු ලකුණු : 16)

(2) පහත සඳහන් මාතෘකා අතරින් එකක් තෝරාගෙන වචන 100-125 අතර රචනාවක් ලියන්න.

i) මා කැමති ම ගත් කතුවරයා

ii) සීගිරි අසිරිය

iii) ශ්‍රී ලංකාවේ සුන්දරත්වය

iv) මා කියවූ රසවත් ම පොත

v) ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ සූරීන් (ලෑ:14)

(3) කවි පෙළ කියවා අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු ලියන්න

ගුමු ගුමු ගා මොකද හො රෝ
අහකට පල වන බඹ රෝ
රෝස මලේ ළඟට ව රෝ
අපි ඊ උඹේ සොහො යු රෝ

පැහැයට ගැළපෙන සුවඳ ත්
පිටම නිසි හැඩ හුරුව ත්
උඹට වගේ වෙන මලක ත්
ඇතොත් සතුටු නේ ද උඹ ත්

උඹ නැති නම් මල් ව ත්තේ
හරි සිරියාවක් නැ ත්තේ
විහිදෙන මේ හැම පැ ත්තේ
සුවඳ කොහෙන් ඇර ග ත්තේ

i) ඉහත පද්‍ය පෙළේ සංවාදය ඇතිවන්නේ කවුරුන් අතර ද?

ii) මෙහි සඳහන් වන අලංකාර මල කුමක් ද?

iii) එම මලේ සුවිශේෂ ලක්‍ෂණ දෙකක් ලියන්න

iv) මල් වත්තේ සිරියාවක් ඇති නොවන්නේ කිනම් අවස්ථාවක ද?

v) පහත පදවලට සමාන පද ලියන්න.

1/ පැහැය 11/ සුවඳ (ල:10)

(4) පාසල් නේවාසිකාගාරයේ සිටින ඔබගේ ද ශ්‍රම දායකත්වයෙන් ඇසළ පෝය නිමිති කර ගෙන සකස් කෙරෙන තොරණ නැරඹීමට එන ලෙස දන්වමින් පියාට යවන ලිපිය ලියන්න.

(ල:10)

(5) (I) " නැහැ මැරෙනවා නම් ඌ බෙල්ල ඉදිමෙන කල් ජීවත් වෙන්නේ නැහැ "

i) මෙය කියන ලද්දේ කවුරුන් විසින් ද?
ii) එසේ කීවේ කාට ද?
iii) මෙම පාඩම උපුටා ගෙන ඇත්තේ කිනම් පොතෙන් ද?
iv) එම පොතේ කතුවරයා කවුරුන් ද?
v) එම කතුවරයාගේ වෙනත් කෘතියක් ලියන්න.

(ල:5)

(II) ඉර හඳ පායන ලෝකේ
ආලෝකය අතරේ
..............................
..............................

i) මෙම ගීතයේ ඉතිරි පදය ලියන්න.
ii) මෙම ගීතයේ පද රචකයා කවුරුන් ද?
iii) එතුමා ලියූ කාව්‍ය සංග්‍රහයක් නම් කරන්න.
iv) එතුමා ගී නිර්මාණය කළ චිත්‍රපටයක් නම් කරන්න.
v) එතුමා ලිපි සැපයූ පුවත්පත කුමක් ද?

(ල:5)

(6) " අනේ උඹට පිං අත් වෙයි
මේ ටික ගෙනිහිං දීපං "

i) මෙම ප්‍රකාශය කළේ කවුරුන් ද? කා හට ද?
ii) "මේ ටික" යනු මොනවා ද?
iii) මෙම කොටස ඇතුළත් පාඩමේ නම ලියන්න.
iv) මෙම නාට්‍ය ලියූ රචකයා කවුරුන් ද?
v) එතුමාගේ වෙනත් නාට්‍ය දෙකක නම් ලියන්න.

(ල:10)

(7) යා කරන්න.

i) මුනිදාස කුමාරතුංග - අපේ ගම

ii) මාර්ටින් වික්‍රමසිංහ - ළමා කවි කළඹ

iii) එස්. මහින්ද හිමි - කියවන නුවණ

iv) ටී. බී. ඉලංගරත්න - කෝමල රේඛා

v) ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ - අඹ යහළුවෝ (ල:10)